261

ප්‍රවේශ අංකය 261
වර්ග අංකය

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති
( 1990 සිට 1997 දක්වා)
කැලණිය විශ්ව විද්‍යාලය
සමාජීය විද්‍යාපති උපාධිය
1997

ඩබ්.එම්.ප්‍රදීප් නිශාන්ත

## සාරාංශය

විද්‍යුත් තාක්ෂණයෙන් ශතවර්ෂයකටවත් වැඩි කාලයක් ගෙවී ගොස් ඇති අද අපේ මාධ්‍ය ස්නායු පද්ධතියම ව්‍යාප්ත කොට ඇත්තේ මුළු මහත් විශ්වයම වැළඳගන්නා ලෙසිනි. අප වෙසෙන ග්‍රහලෝකය සම්බන්ධයෙන් සලකා බලන විට, විද්‍යුත් වශයෙන් හැකිළි ඇත්තා සේ විශ්වය, කුඩා ගම්මානයකට වඩා වැඩි යමක් නොවන බව මාෂල් මැක්ලුහන් තම Understanding Media නැමති කෘතියෙන් පෙන්වා දුන්නේය. මෙම විශ්ව ගම්මානය තුළ තොරතුරු සමාජයක් බිහිවන බවටද මත පළවී ඇත.

මෙම තොරතුරු සමාජය බිහි වීමට මූලික වශයෙන් බලපෑ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ශීඝ්‍ර වර්ධනයක් ශ්‍රී ලංකාව ආශ්‍රිතව ද දක්නට ලැබේ. විවෘත වෙළෙඳපොළ ආර්ථිකය,තාක්ෂණයේ සිදු වූ නවීකරණය,මධ්‍යම පංතිකයන් ගේ ජීවන තත්තවය ඉහළ යාම, ගුවන් තරංග වාණිජකරණය යනාදී හේතු මේ වර්ධනයට බලපෑවේය. මෙවැනි වර්ධනයක් එක් පැත්තකින් සිදු වන අතර, අනෙක් පැත්තෙන් ශ්‍රී ලංකාව තුළ නව විද්‍යුත් මාධ්‍යවල ආගමනයන් සමඟ තොරතුරු ලබා ගැනීම සමාජ්ය වරප්‍රසාදයක් හා අභිමානයක් බවට පත් ව ඇත. ඒ අනුව රට තුළ තොරතුරු බෙදීයාමේ දැඩි විෂමතාවයක් දක්නට ලැබේ.

නිදසුන් වශයෙන්

i. පරිගණක,අන්තර්ජාල පහසුකම්,අන්තර් ජාතික විද්‍යුත් මාධ්‍ය පරිහරණය කිරීමේ අවස්ථා හිමි පිරිස සහ පාසලක මූලික පෙළ පොත්වලින් පමණක් තොරතුරු ලබා ගන්නා පිරිස.

ii. පෞද්ගලිකවම ජංගම දුරකථනයකට හිමිකම් කියන පිරිස සහ ගමකට එක දුරකථනයක් හෝ නොමැති වීම.

iii. ඉංග්‍රීසිය උසුරුවන නාගරික සුළුතරය හා ඉංග්‍රීසි කථා නොකරන බහුතරය.

iv. දැඩි ආදායම් විෂමතාව,දුගීබව,ජනවාර්ගික ගැටළු හා සමාජ්ය ගැටළු.

v. අගනුවර ප්‍රභූ සුළුතරය කේන්ද්‍රකරගත් විද්‍යුත් මාධ්‍ය ජාලයක් හා ගුවන් විදුලි යන්ත්‍රයකට හෝ රූපවාහිනී යන්ත්‍රයකට හිමිකමක් නොමැති ග්‍රාමීය හා අර්ධ නාගරික බහුතරය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාෂල් මැක්ලුහන්ගේ විශ්ව ගම්මානයට හා තොරතුරු සමාජයට ආධුනිකයින් වන පිරිසක්ද සිටිති. ඒ නාගරික හා ග්‍රාමීය පීඩිත කණ්ඩායම්ය. මෙම පරස්පරතාවයට හේතුව විග්‍රහ කිරීම මෙම පර්යේෂණයේ එක් අරමුණකි. මෙම පර්යේෂණයේ ප්‍රශ්නය ලෙස මුල්කරගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය සඳහා ප්‍රතිපත්තියක් තිබේද යන්නයි. එසේම ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කෙරෙහි රජය අනුගමනය කළ ප්‍රතිපත්තිය 1990 වසරේදී වෙනස් කිරීමට තීරණය කළේ ඇයි ?. ඒ පිළිබඳව තීරණය ගනු ලැබුවේ කා විසින් ද ?. ඊට තිබුණු ජන පදනම කුමක් ද ? ශ්‍රී ලංකාවේ පැවති සමාජ ආර්ථික පසුබිම තුළින් එවැනි වෙනස් වීමක් සඳහා ඉල්ලීමක් තිබුණද ?. 1990 - 1997 කාල පරාසය තුළ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ රජයේ හැසිරීම විද්‍යුත් මාධ්‍ය නිදහස කෙරෙහි බලපෑවේ කවර අන්දමටද? යන ප්‍රශ්න පදනම් කරගනු ඇත.

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය වන්නේ රටේ ජාතික අභිමතාර්ථ මත නොව දේශපාලන අවශ්‍යතා මත යන උපකල්පනය මෙම පර්යේෂණය සඳහා පදනම් වී ඇත. එය සිදුවන්නේ කෙසේද යන්න විමසුමට භාජනය වේ. ඒ හැරෙන්නට වෙනත් හේතු මේ කෙරෙහි බලපෑවේද යන්න පර්යේෂණයට ලක්වේ.

ශ්‍රී ලංකාව වැනි සමාජ, ආර්ථික වටපිටාවක් ඇති තුන්වෙනි ලෝකයේ රටවල ජනමාධ්‍යයන්ගේ අරමුණු විනෝදාස්වාදය සැපයීමට පමණක් සීමා නොවිය යුතුය. මෙවැනි රටවල ජාතික ඒකාග්‍රතාව සහ සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රබල මෙවලමක් ලෙස ජනමාධ්‍ය වල වැදගත්කම ඉස්මතු වී ඇත. මේ සඳහා මාධ්‍ය කේන්ද්‍රීය බව, නාගරික කේන්ද්‍රීය බව සහ ප්‍රභූ කේන්ද්‍රීය බව වෙනුවට ග්‍රාහක කේන්ද්‍රීය බව ග්‍රාමීය හා අර්ධ නාගරික කේන්ද්‍රීය බව, දිළිඳු ජන කේන්ද්‍රීය බව, කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව ගැන මෙම පර්යේෂණයේ දී විමසා බැලේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව හා එහිදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය කුමක්ද යන්න සාකච්ඡා කෙරේ.

**න්‍යායික පසුබිම.**

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍යයන්ගේ බහුවිධකරණයක් දක්නට ලැබුණ ද ඊට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණගත් ආකාරය, ඊට ප්‍රතිපත්ති සම්පාදනය වූයේ ද ?. මෙම විද්‍යුත් මාධ්‍ය බහුවිධකරණයේ ප්‍රතිඵල කවරේද ? යන්න පිළිබඳව පරිපූර්ණ විද්‍යාත්මක පර්යේෂණ මෙතෙක් සිදු වී නොමැත. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රතිපත්තියට අදාළව සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳව පර්යේෂණ කිහිපයක් සිදු කර ඇත. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිළධාරියකු වූ අනුර ගුණසේකර මහතා "Communication Policies

and planning in Sri Lanka" ග්‍රන්ථය මගින් 1805 සිට 1978 දක්වා එක් එක් සන්නිවේදන අංශයන් ප්‍රභවය වූ ආකාරය සාර්ථක ලෙස සාකච්ඡා කර ඇත. එම්.ඒ. ද සිල්වා මහතා සහ රෙජී සිරිවර්ධන මහතා "Communication Policies in Sri Lanka" යන ග්‍රන්ථයෙන් ශ්‍රී ලංකාවේ සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳව පුළුල්ව සාකච්ඡා කර තිබේ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වු කුමාර් අබේසිංහ මහතා, ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධිය සඳහා "Need for a Media Policy for Sri Lanka" තේමාව යටතේ නිබන්ධනයක් ඉදිරිපත්කර තිබේ. මෙම නිබන්ධනය මගින් ශ්‍රී ලංකාවට මාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාව පෙන්වා දී ඇත. එහෙත්, මෙහිදි විද්‍යුත් මාධ්‍ය සුවිශේෂීව ගෙන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පවතින ප්‍රායෝගික තත්ත්වයන්ට අදාළ කරුණු පිළිබඳ අවධානය යොමු වී නොමැත.

මාධ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව මෙතෙක් ලිය වී ඇති ග්‍රන්ථවලින් ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය සුවිශේෂව ගෙන විශ්ලේෂණාත්මක විග්‍රහයක් කර නොමැත. වර්තමානයේ ශ්‍රී ලාංකික සමාජය කෙරෙහි ප්‍රබල බලපෑමක් කර ඇති විද්‍යුත් මාධ්‍ය පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය වු ආකාරය හඳුනා නොගැනීම අඩුපාඩුවක් වශයෙන් පෙනෙන්නට තිබේ. එම ඌනතාව සපුරාලීමට මෙම පර්යේෂණයෙන් උත්සාහ කෙරේ. විධිමත් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ජාතික සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය මෙහිදී විමසුමට භාජනය වේ.

## නිර්වචනය කිරීම.

සන්නිවේදනය සමාජ ක්‍රියාවලියක් සහ මානව සම්බන්ධතා ඉදිරියට ගෙන යන වාහකයෙකි[1]. සන්නිවේදනය මිනිසාගේ මූලික අවශ්‍යතාවකි. කොලියර් විශ්ව කෝෂය[2], කොළොම්බියා විශ්ව කෝෂය[3], ඔක්ස්පර්ඩ් ශබ්ද කෝෂය[4], වැනි ග්‍රන්ථවලත් විල්බර්ශ්‍රාම්[5], වාල්ස් කුලී[6], එඩ්වින් එමරි[7] යන සන්නිවේදන විද්වතුන්ද සන්නිවේදනය යන්න නොයෙකුත් ආකාරයට විග්‍රහ කර තිබේ. මේ විග්‍රහයන්ට අනුව එකිනෙකා පොදුවේ අදහස් හුවමාරුකර ගැනීම සන්නිවේදනය වශයෙන් හැඳින්විය හැකිය.

ඕනෑම සමාජයක සන්නිවේදන ක්‍රම එම සමාජයේ මූලික පදනම මත සකස් වේ. ගල් ගුහා,ගෝත්‍රික,කෘෂිකාර්මික සමාජවලදී මූලික සන්නිවේදන ක්‍රම බිහි වූ අතර, කාර්මික සමාජයේදී විද්‍යුත් මාධ්‍යයන්ගේ ප්‍රභවය සිදුවිය. මෙම විද්‍යුත් මාධ්‍යයන්ගේ වර්ධනයට මූලික වුයේ ට්‍රාන්සිස්ටරයයි. පසුව ට්‍රාන්සිස්ටර දස දහස් ගණනක් අඩංගු චිප නිපදවීමෙන් පරිගණකය බිහිවිය. පරිගණකය, දුරකථනය හා සම්බන්ධකර පරිගණක ජාලයක් හා එක් කිරීමෙන් අන්තර්ජාලය (internet) නමින් හැඳින්වෙන නූතන සන්නිවේදන මාධ්‍ය බිහිවිය.

අභ්‍යවකාශතරණය, චන්ද්‍රිකා තාක්ෂණය, හා පරිගණකය නිසා අද ලෝකය එකම ගම්මානයක් බවට පත්වෙමින් තිබේ. සංවර්ධිත රටවල විද්‍යුත් මාධ්‍යන්ගේ ශීඝ්‍ර ව්‍යාප්තියක් දක්නට ලැබුණද ශ්‍රී ලංකාව වැනි තුන්වෙනි ලෝකයේ රටවල විද්‍යුත් මාධ්‍ය අගනුවර ප්‍රභූ කේන්ද්‍රීය ස්වභාවයක් ගනියි. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය මෙවලම හිමියන්ගේ බහුතරය, නාගරිකව ජීවත් වන මධ්‍යම පංතික ජනතාවයි. ඉහළ සමාජ ආර්ථික තත්ත්වයන් ඇති ජන කොටස් වලට මෙම විද්‍යුත් මාධ්‍යන් මගින් බාහිර තොරතුරු ලබා ගැනීමේ නව මං පැදෙනා බැවින්, සමාජයේ මාධ්‍ය ආඪ්‍ය (Media rich) සහ මාධ්‍ය ඌන (Media poor) අතර පරතරය පුළුල් කරයි. මේ හේතුවෙන් රටේ 78% ක් වන ග්‍රාමීය ජනතාව උග්‍ර තොරතුරු මන්දපෝෂණයකින් පෙළෙමින් සිටිති.

## රාජ්‍ය ප්‍රතිපත්ති

ප්‍රතිපත්ති යන්න යම්කිසි ක්‍රියාවලියක් පෙන්නුම් කිරීමට භාවිතා කරයි. ඩබ්.හොග්වුඩ් සහ ලෙවින් ට[8] අනුව ප්‍රතිපත්ති යනු කුමන පුද්ගලයන්ගේ හෝ තීරණ සමුදායකි. ඩේවිස් ඊස්ටන්[9] ට අනුව නීතිමය බලයක් අනුව සමාජයට හර කොටසක් බෙදා හැරීම රාජ්‍ය ප්‍රතිපත්තියයි. තෝමස් ආර් ඩයි[10] පවසන්නේ ප්‍රතිපත්තියක නිශ්චිත පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් සහ යමක් කිරීමේ අදහසක් ද පැවතිය යුතු බවයි. ඔහු මෙසේද පවසයි. රජයක් කරන්නට යනදේ හෝ නොකරන දේ රාජ්‍ය ප්‍රතිපත්තියය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අර්ථ දැක්වීම්වලට අනුව රාජ්‍ය ප්‍රතිපත්තියක් යනු ක්‍රියාවට මගපෙන්වීමකි. පොදුවේ ගත් විට රාජ්‍ය ප්‍රතිපත්තියක පහත සඳහන් ගුණාංග තිබිය යුතුය.

i. අධිකාරීත්වයක් තිබීම.

ii. හරයන් එකතු කිරීමක් තිබීම.

iii. යමක් කිරීමේ අදහසක් පැවතීම.

iv. ස්ථිරසාර බව

v. විවෘත භාවය

vi. පැහැදිලි ලෙස ප්‍රකාශවීම

vii. ජනතා සහභාගීත්වයක් තිබීම.

## ක්‍රමවේදය.

මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලික වෙනසක් සිදු වූ 1990 සිට 1997 දක්වා වකවානුව නියැදියක් වශයෙන් තෝරා ගෙන ඇත. මෙම කාල සීමා තුළ විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් රජය අනුගමනය කළ ක්‍රියා මාර්ග නිසා ඇති වූ සිද්ධි කිහිපයක් ඇසුරු කර ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්තිය විශ්ලේෂණය කරනු ලැබිය.

i. 1990 මාර්තු මස 14 වන දින ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ආයතන ඇරඹීමට පෞද්ගලික අංශයට අවසර දීමට රජය තීරණය කළ ආකාරය හා එය ක්‍රියාත්මක වූ ආකාරය.

ii. 1988 සිට 1994 දක්වා පැවති මැතිවරණවලදී දිවයිනේ විවිධ දේශපාලන පක්ෂ ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සන්නිවේදන ප්‍රතිපත්ති සැලකිල්ලට ගැනීම.

iii. 1995 පෙබරවාරි මස 06 වන දින ශ්‍රී ලංකාවේ රාජ්‍ය ගුවන් විදුලියේ නව අධ්‍යාපන සේවය තහනම් කිරීම.

iv. 1996 අප්‍රේල් මස 05 වන දින ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතනයක් වන සිරස FM සහ Yes FM ගුවන් විදුලි සේවාවල ප්‍රවෘත්ති ප්‍රචාරය තහනම් කිරීම.

v. 1997 මාර්තු මස 24 දින ශ්‍රී ලංකා විකාශන අධිකාරි පනත ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීම.

මෙම පර්යේෂණය සිදු කරන ලද්දේ 1990 සිට 1997 දක්වා විද්‍යුත් මාධ්‍ය හා රජය අතර පැවති සම්බන්ධතාවය පිළිබඳව අදාළ කාල පරාසය තුළ පුවත්පත් සඟරා හා ලිපි ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව මේ පිළිබඳව ලබාගත් මූලික අවබෝධයකින් පසුවයි. මාධ්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති වලට අදාළව ජාත්‍යන්තර වශයෙන් කෙරුණු පර්යේෂණ කෘති, ඉන්දියාව, දකුණු අප්‍රිකාව, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ඇමරිකාව යන රටවල විද්‍යුත් මාධ්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වී ඇති ආකාරයත් විමර්ශනයට භාජනය කරනු ලැබිය.

මීට අමතරව ප්‍රශ්නාවලියක් සකස් කර සංයුක්ත සමීක්ෂණයකින් කරුණු විශ්ලේෂණය කරනු ලැබිය. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට හා ඒවා ක්‍රියාත්මක කිරීමට සෘජුව මැදිහත් වූ පුද්ගලයන් සහ ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් සමාජයට සිදු වූ බලපෑම පිළිබඳව න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කළ හැකි පුද්ගල කණ්ඩායමක් නියැදියක් වශයෙන් තෝරාගෙන ඔවුන් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත්කර අදහස් ලබාගන්නා ලදී. සෑම පුද්ගලයකුටම ඉදිරිපත් කරන ලද්දේ එකම ප්‍රශ්නාවලියකි. සංයුක්ත සමීක්ෂණය සඳහා ප්‍රශ්නාවලියක් උපයෝගිකර ගැනීම නිසා තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී ප්‍රශ්නාවලි මත පදනම් වූ ක්‍රම විද්‍යාව උපයෝගි කරගෙන තිබේ.

**නිගමනය**

ශ්‍රී ලංකාවට විද්‍යාත්මකවූත් පාථුලවූත් විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ. එම ප්‍රතිපත්ති මගින් සියලුම මාධ්‍ය සංඝටක වල අදාල අවශ්‍යතා හා ප්‍රශ්න සැලකිල්ලට ගත යුතුය. ශ්‍රී ලංකාවේ දැනට පවත්නා ජනමාධ්‍ය සම්බන්ධ විවිධ අණපනත් එක් වූ විට පරිපූර්ණ මාධ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය වන බවට පවතින අදහස පිළිගත නොහැකිය. විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්තියක් යන්නෙන් අදහස් වන්නේ රටේ විද්‍යුත් මාධ්‍ය ජාලය කාලීන අවශ්‍යතාවලට සංවේදීවන අයුරින් ක්‍රමානුකූල හා විධිමත් ආකාරයට සංවර්ධනය කිරීම අරමුණුකරගත් ජාතික රාමුවකි. දැනට ව්‍යවහාරේ පවතින පාර්ලිමේන්තු අණපනත් මෙම අවශ්‍යතාව සපුරන පොදු ප්‍රතිපත්තියක් නිර්මාණය නොකරයි.

මීට අමතරව රටේ පවතින විවිධ දේශපාලන පක්ෂ මැතිවරණවලදී ඉදිරිපත්කරන ප්‍රතිපත්ති ප්‍රකාශනවල විද්‍යුත් මාධ්‍ය සම්බන්ධව දක්වන කරුණු විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වාදීමට උත්සහගත්තද එය යථාර්තවාදී අදහසක් නොවේ. 1990 සිට 1997 දක්වා වකවානුව තුළ දේශපාලන පක්ෂ මැතිවරණවලදී ඉදිරිපත්කළ ප්‍රතිපත්ති ප්‍රකාශවල අඩංගු කරුණු එම පක්ෂ බලයට පත්වීමෙන් පසු ක්‍රියාත්මක කිරීමේ දී දැඩි පරස්පරතාවයක් දක්නට ලැබේ. මේවා බලයට පත්වීමෙන් පසු නීතිගත ලියවිලි බවටද පත්කර නොමැත. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන හුදෙක් මැතිවරණ සමයේ සක්‍රිය මැතිවරණ අවසානයේ අක්‍රිය වන ලේඛනයක් පමණි. අනික් අතට විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්තියක් තුළින් මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව සාර්ව දෘෂ්ඨියක් ප්‍රකාශ විය යුතු වුවද, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන තුළින් එවැන්නක් සිදු නොවේ. මෙයින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් නොමැති බවයි. 1990 - 1997 ශ්‍රී ලංකාවේ තත්ත්වය නිරීක්ෂණය කරන විට පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැති අතර විද්‍යුත් මාධ්‍ය පිළිබඳව වරින්වර ගනු ලැබූ තීරණ සමුදායක් පමණක් දක්නට ලැබෙණ බවයි. මෙම තීරණමත විද්‍යාත්මක පදනමක සිට ප්‍රතිපත්ති සම්පාදනය වීමක් සිදු වී නොමැත.

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍ර තුළ ජනමාධ්‍ය අමාත්‍යංශයටද විශාල බලතල ප්‍රමාණයක් හිමි වී තිබීම නිසා විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි රජය විශාල බලපෑමක් එල්ල කරයි. මෙය රටේ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට බාධාවක්ව පවතියි. බොහෝ විට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ විද්‍යුත් මාධ්‍යයන්ටද රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ඔස්සේ රජයේ මැදිහත් වීම 1979 සිට වර්තමානය දක්වාම විද්‍යමාන වේ. 1995 පෙබරවාරි මස 6 වන දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නව අධ්‍යාපන සේවය තහනම් කිරීම, 1996 අප්‍රේල් මස 5 වන දින පෞද්ගලික ගුවන් විදුලි මධ්‍යස්ථානයක් වන "සිරස FM සහ YES FM" ගුවන් විදුලි සේවාවල ප්‍රවෘත්ති ප්‍රචාරය තහනම් කිරීම වැනි දෑ සිදු වන්නේ මේ ආකාරයට රජයේ මැදිහත් වීම තුළිනි.

මීට අමතරව රාජ්‍ය මාධ්‍ය ආයතනවල ඉහළ පෙළේ නිළධාරීන්, පෞද්ගලික අංශයේ මාධ්‍ය ආයතන හිමිකරුවන්, මාධ්‍යකරුවන්ගේ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, රටේ දේශපාලන පක්ෂ හා කණ්ඩායම්, විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමෙහිලා බලපාන බව පෙනේ. ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය කර්මාන්තය විධිමත් කිරීම සඳහා 1997 අප්‍රේල් මාසයේදී රජය විසින් ශ්‍රී ලංකා විකාශන අධිකාරි පණත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේ ඇති වූ තත්ත්වය මීට නිදසුන් වශයෙන් දැක්විය හැකිය. මෙම පණතට විරුද්ධව ඉහත සඳහන් ආයතන හා පුද්ගලයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එම පණත නීතිගත කිරීම අත්හිටුවනු ලැබීය.

රටක විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී රටේ ජාතික අභිමතාර්ථ, ජාතිය ගොඩනැගීම, සංවර්ධනය, ඓතිහාසික තත්ත්වයන්, සමාජ, ආර්ථික පාරිසරික හා තාක්ෂණික පසුබිම හා රටේ පුරවැසියන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගත යුතුය. එහෙත් 1990 - 1997 වකවානුව තුළ මේ සියළු සාධක අභිබවා බලයේ සිටින දේශපාලන අධිකාරියේ අවශ්‍යතා හා සිතුම් පැතුම් මත විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති තීරණය වී තිබේ. අලිබිත හා හදිසි අවශ්‍යතාවයන් යටතේ තමන්ගේ අරමුණු ඉටුකර ගැනීමට බලයේ සිටින දේශපාලන පක්ෂ විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති වරින් වර වෙනස් කරයි. රාජ්‍ය පාලනය යටතේ පවතින විද්‍යුත් මාධ්‍යයන්ට රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීමට නොහැකිව ඇත්තේ රජයේ දේශපාලන අවශ්‍යතාවයන්ට මුල්තැනක් දී කටයුතු කිරීමට යාමේදී තමවැඩසටහන් වල මූලික අභිමතාර්ථයන්ගෙන් බැහැරව ප්‍රචාරකවාදී ස්වරූපයට මාරුවන බැවිනි. බලයේ සිටින ආණ්ඩු තම පරිපාලන තීරණ හා දේශපාලන ව්‍යාපෘති ජනතාවට දැනුම් දීම සඳහා මෙම මාධ්‍ය භාවිතා කරයි. රජයේ මාධ්‍යයන්ටද රාජ්‍ය ප්‍රතිපත්ති මාලාවක් මඟින් මඟපෙන්වීමක් කර නොමැති නිසා එම ආයතනවලට ද මෙම දේශපාලන අධිකාරීන්ගෙන් මිදී ක්‍රියාත්මකවිය නොහැකිය. මේ හේතුවෙන් රාජ්‍ය මාධ්‍යන්ගේ ජනප්‍රියත්වය හීන වී තිබේ. මෙම තත්ත්වය යටතේ 1997 වන විට රාජ්‍ය පාලනය යටතේ පවතින විද්‍යුත් මාධ්‍යන්ගෙන් ජනතාව ඈත්වීමක් දක්නට ලැබේ.

අලිබිත හා හදිසි අවශ්‍යතාවන් යටතේ තම අරමුණු ඉටුකරගැනීමට බලයේ සිටින දේශපාලන අධිකාරීන් විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති වරින් වර වෙනස් කිරීමේ ප්‍රබල අවස්ථාවක් වශයෙන් 1990 දී පෞද්ගලික අංශයට විද්‍යුත් මාධ්‍ය ආයතන ඇරඹීමට අවසර දීමේ දී අනුගමනය කරනු ලැබූ ක්‍රියාමාර්ග දැක්විය හැකිය. මේ සඳහා අවසර දීමේ බලපත්‍ර, රජයේ සමීපතමයන්ට ලබා දීම නිසා එය ගුප්ත ස්වරූපයක් ගත්තේය. මෙම තීරණය ක්‍රියාත්මක වුවද ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය වීමක් සිදු වී නොමැත. රාජ්‍ය ප්‍රතිපත්තියක අඩංගු වියයුතු මූලික ගුණාංග වන,

i. විවෘත බව
ii. පැහැදිලි බව
iii. ජනතා සහභාගීත්වයක් තිබීම.

මෙහිදී දක්නට නොලැබේ. 1990 දී විද්‍යුත් තරංගමාලා භාවිතයට පෞද්ගලික අංශයට අවසර දීමේ තීරණය සමාජ්‍ය අවශ්‍යතා මත ගනු ලැබුවක් නොව පෞද්ගලික අවශ්‍යතා මත ගනු ලැබුවකි.

1990 වසරේ දී විද්‍යුත් තරංගමාලා භාවිත කිරීමේ අයිතිය පෞද්ගලික අංශයට පැවරීමට තීරණය කිරීමේ දී, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී අනුගමනය කරන මූලික සංකල්ප පිළිබඳව සැලකිලිමත් නොවීමත් ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය නොවීමත් හේතුවෙන් 1990-1997 කාල සීමා තුළ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය හා ලාංකීය සමාජය ආශ්‍රිතව ගැටළු ගණනාවක් මතු වී තිබේ.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

i. රට තුළ තොරතුරු බෙදා හැරීමේ හා විනෝදස්වාදය ලැබීමේ විෂමතාවයක් ඇතිවීම (හීන මාධ්‍ය ග්‍රහණය හා අධි මාධ්‍ය ග්‍රහණය අතර පරතරය පුළුල් වීම)
ii. නාගරික ප්‍රභූ පංතිය විසින් අදහස් වෙළෙඳපොළේ සිය ආධිපත්‍ය 78% ක් වන ග්‍රාමීය ජනතාව මත ක්‍රියාත්මක කිරීම නිසා රට තුළ අධිපතිවාදී සන්නිවේදන ව්‍යුහයක් නිර්මාණය වීම.
iii. මෙම විද්‍යුත් මාධ්‍ය නාගරික පාරිභෝගික සමාජය ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වීම හේතුවෙන් රටේ බහුතරය වන ග්‍රාමීය ජනතාව නිශ්ක්‍රිය ග්‍රාහකයකු බවට පත්කර ඔහු තුළ අනවශ්‍ය පාරිභෝගික අවශ්‍යතා ඇති කිරීම.
iv. රටේ විද්‍යුත් මාධ්‍ය පද්ධතිය රටේ පුරවැසියන්ගේ කාලීන අවශ්‍යතාවන්ට, රටේ ජාතික අභිමතාර්ථ මත පදනම් වූ සංවර්ධනාත්මක අරමුණුවලට සංවේදීවන අයුරින් ක්‍රමානුකූලව හා විධිමත්ව සංවර්ධනය නොවීම.
v. රටතුළ විනෝදාස්වාදය අළෙවි කිරීම සඳහා තරඟකාරීත්වයක් ඇති වීම.
vi. රාජ්‍ය පාලන යටතේ පැවති ගුවන් විදුලි හා රූපවාහිනී මධ්‍යස්ථාන වල භූමිකාව කුමක්ද? රජයේ නව භූමිකාව කුමක්ද යන්න අපැහැදිලි වීම.
vii. විද්‍යුත් මාධ්‍යන්හි අන්තර්ගත ප්‍රමිතිය තීරණය කිරීම හා නිරීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් නොමැති වීම.

මෙම තත්ත්වය කෙතරම් අමිහිරි වුවත් මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් මුහුණු දෙන යථාර්ථය හා අභියෝගය මෙයයි. ලෝකයේ බොහෝ රටවල පෞද්ගලික විද්‍යුත් මාධ්‍ය ආරම්භ කිරීම සඳහා බලපත්‍ර ලබාදීමට මධ්‍යගත පාලන අධිකාරියක් පවතියි. කැනඩාවේ පවතින නීතියට අනුව කැනේඩියානු නොවන ජාතිකයන් එරට විද්‍යුත් මාධ්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවලට පත්කළ නොහැකිය.

ස්විධනය විදේශීය ජාතිකයන්ට එරට විද්‍යුත් මාධ්‍ය ආයතනවල කොටස් ලබාගැනීමට හෝ එම ආයතනවල සේවය කිරීමට ඉඩදී නැත. එහෙත් ශ්‍රී ලංකාවේදී මෙම තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස් මුහුණුවරක් ගනියි. මෙයින් පැහැදිලි වන්නේ ලෝකයේ බොහෝ රටවල විද්‍යුත් මාධ්‍යයන් විදේශීය බලපෑම්වලින් ආරක්ෂාවීමටත් විද්‍යුත් විකාශන කර්මාන්තය විධිමත්ව පාලනය කිරීම සඳහාත් පියවරගෙන ඇති බවයි. එහෙත් ශ්‍රී ලංකාවේ මෙවැනි තත්වයක් දක්නට නොලැබෙන අතර ඒ හේතුවෙන් විද්‍යුත් මාධ්‍ය විකාශන කර්මාන්තය ව්‍යාකූල ස්වරූපයක් ගෙන තිබේ.

ලෝකයේ බොහෝ රටවල විද්‍යුත් මාධ්‍ය කර්මාන්තය ජාත්‍යන්තර ගිවිසුම් සහ ප්‍රඥප්තීන්ට අනුව සැකසූ රට අභ්‍යන්තරයේ පවතින නීති පද්ධති මගින් පාලනය වේ. මේවා ලිඛිත,අලිඛිත,වාචික හෝ කලාවන් වශයෙන් ද පවතියි. එහෙත් ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රයට අදාළ නීතිමය තත්ත්වයන් කාලීන සමාජ ආර්ථික වෙනස්කම්වලට අනුව වෙනස්කර නොමැත. මේ හේතුවෙන් විද්‍යුත් මාධ්‍යන්හි ක්‍රියාකාරිත්වයට නිසි මග පෙන්වීමක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති පද්ධතියෙන් පෙන්නුම් නොකරයි.

## න්‍යායික ගැටළු

ශ්‍රී ලංකාවේ ඉහළම ප්‍රතිපත්ති සම්පාදන ආයතනවන්නේ කැබිනට් මණ්ඩලය සහ පාර්ලිමේන්තුවයි. මීට අමතරව රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ නිලධාරීහුද මේ සඳහා දායක වෙති. මෙම ප්‍රතිපත්ති සම්පාදකයින්ට අදාළ ප්‍රතිපත්ති පිළිබඳව යෝග්‍ය හා අර්ථාන්විත විවේචනාත්මක සංවාදයකට සහභාගිවීමට අවස්ථාවක් නොමැත. එක් අතකින් ඔවුන්ට මේ සඳහා වේලාවක් නොමැති අතර පුළුල් වශයෙන් මහජන අදහස් විමසීම, ඔවුහු ඉතාම නොවැදගත් කරුණක් වශයෙන් සලකති. ජනමාධ්‍ය කටයුතු පිළිබඳ කැබිනට් අනුකාරකසභාවක් සහ පාර්ලිමේන්තු කාරකසභාවක් පැවතුන ද එම ආයතනද අක්‍රිය වී තිබේ.

විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය යුක්තිසහගත බව සහ ප්‍රජාතාන්ත්‍රීය බව යන මූලධර්ම දෙක මත පදනම් විය යුතුය. අදාළ ප්‍රතිපත්ති තෝරාගත යුත්තේ ලැබිය හැකි ප්‍රතිඵල සැලකිල්ලට ගනිමිනි. අනික් අතින් මෙම ප්‍රතිපත්ති සුළුතරයකට වාසි සහගත වන අතර බහුතරයකට මිළ අධික අවාසි සහගත වේ, නම් එම ප්‍රතිපත්ති ප්‍රජාතන්ත්‍රීයව සම්පාදනය වූවක් නොවේ. එහෙත් වර්තමානයේ යුක්තිසහගතව ප්‍රතිපත්ති සම්පාදනය අතිශයින් සංකීර්ණ දුෂ්කර කටයුත්තකි. ආර්ථිකය හා ජනමාධ්‍ය විසින් ලෝකය ශීඝ්‍රයෙන් ගෝලීකරණය වන වටපිටාවක් තුළ, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය, සංකීර්ණ දේශපාලන ආර්ථික, සමාජ, සංස්කෘතික සාධක හා බද්ධව පැවතීම හේතුවෙන්, හුදකලාව කළ

නොහැකිය. ඒ සඳහා අභ්‍යන්තර හා බාහිර ව්‍යාප්තිය සැලකිල්ලට ගැනීමට සිදු වේ. මෙම සියළු කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධ ක්‍රියාකාරකම්වලදී මහජන අදහස් ලබාගැනීම, ජාතික නායකයින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු,ඉහළ පෙළේ නිලධාරීන්, ඒකරාශි කිරීම ඉතාම සංකීර්ණ අභියෝගයකි.

## යෝජනා

ශ්‍රී ලංකාව සුවිශේෂව සලකා බලනවිට ජනගහනයෙන් බහුතරය දරිද්‍රතා කඩඉමේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. පෞද්ගලික වාණිජ විද්‍යුත් මාධ්‍ය මෙම බහුතරයට දරාගත නොහැකි අනවශ්‍ය පරිභෝජන රටාවන්ට හුරුකර ඇත. මෙම තත්ත්වයෙන් ඔවුන් මුදවාගත හැක්කේ ඔවුන්ගේ සමාජ, ආර්ථික,සංස්කෘතික අවශ්‍යතා ඉටුකර ගැනීමේ වාහකයක් ලෙස විද්‍යුත් මාධ්‍ය භාවිතා කිරීමට ඔවුන්ට ඉඩ සැලසීමෙනි. ඒ සඳහා පුරවැසියා පදනම් කරගත් විද්‍යුත් මාධ්‍ය ජාලයක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. ඒ අනුව මීට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයේදී විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය දේශපාලනයෙන් සහ වෙළෙඳපොළ ග්‍රහණයෙන් හැකි තරම් ඈත් කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය. එහෙත් මෙම තත්ත්වයට පූර්ණ වශයෙන් ළඟාවීම යථාර්ථවාදී අදහසක් නොවේ. නමුත් අවම වශයෙන් පුරවැසියා පාදක කරගත් විද්‍යුත් මාධ්‍ය ජාලයක් ගොඩනැගීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කැපවීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමය තුළ ජනතාවට තමන් කැමති දේ තෝරාගැනීමට හැකි වන ආකාරයට තොරතුරු ලබාදීමේලා ප්‍රමුඛ පෙළේ භූමිකාවක් රඟ දැක්විය හැකි ආකාරයට ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කළ යුතුය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 78% ක් ග්‍රාමීය ජනතාව නිසා විද්‍යුත් මාධ්‍ය මගින් ඔවුනට සරිලන තොරතුරු ලබා දීමටත්, රටේ ප්‍රතිපත්ති තීරණය කිරීමේ ක්‍රියාවලියට හා සංවර්ධන ක්‍රියාවලියට ඔවුන් දායක කර ගැනීමටත් වඩාත් උචිත මාධ්‍ය වන්නේ ගුවන් විදුලියයි. විද්‍යුත් මාධ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

මෙසේ සකස් කරන විද්‍යුත් මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක පදනම විය යුත්තේ මහජන සුභසිද්ධිය සහ විද්‍යුත් මාධ්‍ය ප්‍රජාතාන්ත්‍රීකරණයයි. ඒ අනුව අගනුවර ප්‍රභූ පංතිය කේන්ද්‍රකරගත් මාධ්‍යගත විද්‍යුත් මාධ්‍ය ජාලයක් වෙනුවට ග්‍රාමීය හා අර්ධ නාගරික ජනතාව කේන්ද්‍රකරගත් විමධ්‍යගත මාධ්‍ය ජාලයක් රට තුළ ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ හැකිය. ග්‍රාමීය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන මධ්‍යස්ථාන පිහිටුවීම පිළිබඳව ඉදිරිපත් වී ඇති යෝජනාව මීට එක් විකල්පයකි.

ග්‍රාමීය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන මධ්‍යස්ථානයක් යන්නෙන් අදහස් කරන්නේ අන්තර් ජාල පහසුකම් සහ විවිධ ආයතනවල ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත ඇතුළත් ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථානයකි. මෙම මධ්‍යස්ථානයට ජාත්‍යන්තර රූපවාහිනී සේවා නැරඹීමේ පහසුකම්, පුස්තකාලයක් සහ ක්‍රීඩාගාරයක් ද ඇතුළත් වේ. ප්‍රජාවට මෙම මධ්‍යස්ථාන වලට පැමිණ තමන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමටත්, තමන් සතුව තිබෙන තොරතුරු බෙදාහැරීමටත් ඉඩ සැලසිය හැකිය. මෙමගින් රටේ පුරවැසියන්ගේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කරමින් ඔවුන්ට විද්‍යුත් මාධ්‍ය පරිහරණය කිරීමේ ඉඩකඩ සලසා දිය හැකිය.

මීට අමතරව රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ ක්ෂේත්‍ර වලට අදාළ විධිවිධාන ඇතුළත් කර ඇතිවාක් මෙන්ම, රටේ හතරවෙනි ආණ්ඩුව වශයෙන් සැලකෙන ජනමාධ්‍යන්ට අදාළ ප්‍රතිපත්ති සම්බන්ධව විධිවිධාන ද ඇතුළත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ හැකිය.